සඳැස් කවියට අත්වැලක්



ආචාර්ය
ඥානතිලක හේවාගමගේ

## පස්වැනි කොටස:
# සිවුපද විරිත් තව දුරටත්

මෙම ලිපි පෙළේ තෙවැනි කොටසේ දී අපි සිවුපද විරිත් පිළිබඳව විමසීම ආරම්භ කළ අතර මැදුම් ඡන්දසට අයත් විරිත් දක්වා වූ කරුණු සාකච්ඡා කළෙමු. මැදුම් ඡන්දසේ විරිත්වලට පසුව, ඊළඟට එන්නේ පාදයක මාත්‍රා හතක් හෝ අටක් සහිත පිහිටි ඡන්දසට අයත් විරිත් ය.

පහත දැක්වෙන්නේ පාදයක් මාත්‍රා හතකින් සමන්විත පිහිටි ඡන්දසට අයත් කවියකි.

කරුණු විමසා
බලන මිනිසා
අනුන් පිණිසා
විඳියි වෙහෙසා

මෙවැනි විරිතක් ගැන පොත පතෙහි සඳහන් නොවන නිසා මෙය නොඅනුදත් විරික් ලෙස හැඳින්විය හැකිය.

පිහිටි ඡන්දසෙහි ඇති ප්‍රචලිත විරිත් දෙකක් වන්නේ හංසගාමී හෙවත් හසගැමි විරිත සහ පද්මාකර හෙවත් පියුමකර විරිතයි.

### හංසගාමී හෙවත් හසගැමි විරිත:

මාත්‍රා අටකින් යුත් මෙම සිවුපදයේ සෑම පාදයක්ම ස ගණ (ල ල ගු) දෙකකින් සමන්විතය. මෙයට අදාල පහත දැක්වෙන පද්‍යය උපුටා ගන්නා ලද්දේ 'එලු සඳැස් ලකුණ' කෘතියෙනි.

මලගා සම ගා - සුලග වෙ ලගා
මලගා සර ගා - මලගා එ ලගා

එලෙසම පහත දැක්වෙන පද්‍යයන් ද හසගැමි විරිතට උදාහරණ ලෙස දැක්විය හැකිය.

දනටා පිනටා - සිතනා දනටා
වටටා පිටටා - රවටා කුමටා

වරදේ බැඳි දේ - පව දේ දුක දේ
හොඳ දේ සැප දේ - කළ දේ පල දේ

හසගැමි විරිත සයවැනි වර්ණ ඡන්දසට අයත් සම වෘත්තයකි.

### පද්මාකර හෙවත් පියුමකර විරිත:

ගුරු ලඝු නියමයක් නැතිව පාදයක් මාත්‍රා අටකින් බැඳ ඇති සිවුපද මෙම විරිතට අයත් වේ. 'එලු සඳැස් ලකුණ' පොතින් උපුටා ගත් පහත සඳහන් කවිය උදාහරණයක් ලෙස ගත හැකිය.

විදුම්නි සිකි පිල් - නටා නෙතුරු මුල්
නරංග සැදි වල් - වනන්ට වෙ නොකල්

එලෙසම පහත පද බැඳ ඇති කවියද පියුමකර විරිතට උදාහරණ වේ.



සිතුම්ඳ නිකැලැල් - පැතුම්ඳ මනලොල්
උපන්න දන රැල් - උතුම්ය සුවිසල්

පියුමකර විරිතට දැක්වූ ඉහත නිදසුන් සයවැනි වර්ණ ඡන්දසට අයත් වෘත්තයන් වේ.

එමෙන්ම නන්දා මාලනී මහත්මිය විසින් ගායනා කරන ගීතයක පහත සඳහන් ගීත බන්ධය ද පද බැඳ ඇත්තේ පියුමකර විරිතට අනුවය.

අරලිය ලන්දට - සඳ පායන විට
තුරුලිය මල් වට - බමරු බමන විට

සිවුපද විරිත්වලට අදාලව මීලඟ ඡන්දස වන්නේ සුපිහිටි ය. මෙම ඡන්දසට අනුව පාදයක මත් නමයක් හෝ දහයක් තිබෙන සිවුපද විරිත් තිබිය හැක. මෙහි ප්‍රචලිත විරිත් කිහිපයක් වන සෙවියත්සර, තිරියත්සර සහ කඳ යන විරිත් පිළිබඳව සලකා බලමු.

### සෙවියත්සර විරිත:

පාදයක් මත් දහයකින් යුතුව, පිළිවෙලින් ද ගණ, න ගණ, ගුරක් සහ ලඝුවකින් බඳිනා ලද්දේ නම් එය සෙවියත්සර විරිත වේ. මෙහි විරාමය ඇත්තේ පාදාන්තයේය. උදාහරණයක් ලෙස 'තිසර' සන්දේශයේ ඇති පහත සඳහන් කවිය සැලකිය හැකිය.

පතේය පවනතේය
වෙතේය නොනැවතේය
යතේය මාවතේය
ගතේය ගිම මුතේය

එසේම පහත සඳහන් කවියද සෙවියත්සර විරිතට අනුව පද බැඳ තිබේ.

වසිය කළු වලාය
දිසිය දිය ගලාය
බසිය බිම ගිලාය
වැසිය දන මළාය

### තිරියත්සර විරිත:

පාදයක් මත් දහයකින් යුතුව, පිළිවෙලින් න ගණ දෙකක් සහ ද ගණයකින් බඳිනු ලැබුව හොත් එය තිරියත්සර විරිත නම් වේ. මෙහිද විරාමය ඇත්තේ පාදාන්තයේ ය. 'තිසර' සංදේශයේ එන පහත සඳහන් කවිය මෙයට උදාහරණයකි.

නිමලිය සුදු වැලිය
සසලිය රල මලිය
සුපුලිය පියුමැලිය
විපුලිය වන විලිය

එමෙන්ම පහත දැක්වෙන කවිය පද බැඳ ඇත්තේ ද තිරියත්සර විරිතෙනි.

හඬන දොඩන දනාය
නැගෙන මැකෙන සිනාය
සිතන පතන කෙනාය
සිහින විමන තනාය

### කඳ විරිත:

ගුරු ලඝු නියමයක් නැතිව පාදයක් මත් දහයකින් යුතුව බඳින සිවුපද කඳ විරිතට අයත් වේ. මෙහිද විරාම ස්ථානය වන්නේ පාදාන්තයයි. 'එලු සඳැස් ලකුණ' පොතින් උපුටා ගන්නා ලද පහත සඳහන් කවිය කඳ විරිතට අයත්ය.

සිසිකර දිග පැතිරි
රාමන අත බැහැරි
මසි දන් දනා තිරි
වනනැස් දරින් පිරි

එසේම පහත දැක්වෙන කවියද අයත් වන්නේ කඳ විරිතටයි.

මුව මුව පෙම ඉතිරි
ගී හඬ තොල මැතිරි
සැම හට වී මිහිරි
දස අත යයි පැතිරි

විරිත් පිළිබඳව තව දුරටත් විස්තර මීලඟ කලාපයෙන් ද බලාපොරොත්තු වන්න.